**<u>ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයෙහි I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u>**

**<u>(2015.01.01 සිට 2021.09.30 දක්වා පුරප්පාඩු සඳහා)</u>**

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ 2015.01.01 දින සිට 2021.09.30 දින දක්වා පැවති පුරප්පාඩුවලට I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා නිවේදන අංක 02 යටතේ මෙම අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළකරන ලද ලිපි අංක MPubAd/AcSD/II/SP Grade (IV වෙළුම) හා 2021.12.29 දිනැති අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අමතර වශයෙනි.

02. එම පුරප්පාඩු පිරවීමේදී අදාළ කර ගැනීම සඳහා මෙහි ඇමුණුම I ලෙස සංශෝධිත ලකුණු පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බව රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APP/07/1696/2021 හා 2022.10.04 දිනැති ලිපිය මඟින් මා වෙත දන්වා ඇත.

**දිනය :** 2022.10.10

කේ.ඩී.එන්. රංජිත් අසෝක
අතිරේක ලේකම් (රාජ්‍ය පාරිපාලන)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

**ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පරිපාටිය (2015.01.01 – 2021.09.30 දක්වා කාලසීමාව සඳහා)**

| අනු අංකය | නිර්ණායක | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 1. | <u>ජ්‍යෙෂ්ඨත්වය</u> | | 90 |
| | I. 1995.07.06 දිනැති අංක 878/11 දරණ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවට (පැරණි සේවා ව්‍යවස්ථාව) අනුව සහ 2010.09.10 දිනැති අංක 1670/33 දරණ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යස්ථාවට (නව සේවා ව්‍යවස්ථාව) අනුව ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියට උසස්වීමෙන් අනතුරුව වන සේවා කාලයට අදාළව සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා (වැඩිම සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත අයදුම්කරුට උපරිම ලකුණ ලබා දී ඊට සමානුපාතිකව අදාළ සෙසු අයදුම්කරුවන්ට ලකුණු ලබාදීම සිදු වේ.) | 50 | |
| | II. 1995.07.06 දිනැති අංක 878/11 දරණ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවට (පැරණි සේවා ව්‍යවස්ථාව) අනුව ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ II පන්තියේ I ශ්‍රේණියට උසස්වීමෙන් අනතුරුව වන සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ සේවා කාලයට අදාළව සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා සහ 2010.09.10 දිනැති අංක 1670/33 දරණ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවට (නව සේවා ව්‍යවස්ථාව) අනුව ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ II ශ්‍රේණියට උසස්වීමෙන් අනතුරුව වන II ශ්‍රේණියේ සේවා කාලයට අදාළව සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා (වැඩිම සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත අයදුම්කරුට උපරිම ලකුණ ලබා දී ඊට සමානුපාතිකව අදාළ සෙසු අයදුම්කරුවන්ට ලකුණු ලබාදීම සිදු වේ.) | 40 | |
| 2. | <u>කුසලතාවය</u> | | 10 |
| | උසස්වීමට සුදුසුකම් සපුරන දිනට පූර්වාසන්න වසර 05 ක කාර්ය සාධන වාර්තා අනුව කුසලතාවය සඳහා ලකුණු ලබාදෙනු ලැබේ. | | |
| | • විශිෂ්ඨ | 02 | |
| | • සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ | 01 | |
| | • සතුටුදායක | 0.5 | |
| | මුළු ලකුණු | | 100 |